# ත්‍රිකාය විශ්වාසය ඇතිවීමට තුඩුදුන් කරුණු

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

**කෙලඹුවේ පඤ්ඤරතන හිමි**

මහායානයේ බොහෝ ධර්මවල බීජ අවස්ථාවන් ථෙරවාදී පොතපතින් දක හැකිය. ත්‍රිකාය විශ්වාසයට තුඩුදෙන කරුණුද ඇතැම් ත්‍රිපිටක ග්‍රන්ථ හා පශ්චාත්කාලීන කෘතීන්ගෙන් ද දක හැකිය. පාළි ත්‍රිපිටකයෙහි එන ඇතැම් දේසනා මීන් පළමුවන කොටස ලෙස සැලකිය හැකියි. දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රය අනුව බුදුවරයකුට කායත්‍රයක් ඇත.

(i) චාතුර්මහාභෞතික කාය,

(ii) මනොමය කාය,

(iii) ධර්මකාය යනු ඒ තුනයි.

චාතුර්මහාභෞතික කාය යනු මව්කුසින් හටගත් සිරුරයි. මනොමය කාය යනු සෘද්ධියෙන් මවා පාන සිරුරයි. ධර්මකාය යනු බුදුන් දෙසූ ධර්ම විනය දෙකයි.

දීඝනිකායේ '' මහාපරිනිර්වාණ සූත්‍රය '' අනුව '' යො බො ආනන්ද මයා ධම්මොච විනයොච දෙසිතො පඤ්ඤත්තො සො මමච්චයෙන සත්ථා ''

යන වැකිය අනුව බුදුන් නැතිවිට ධර්මය ඒ තත්ත්වයෙන් සැලකීමට උපදෙස් දී ඇත. මජ්ඣිම නිකායේදී වක්කලි හිමියන්ට දෙසූ උපදෙස්හිදී '' අලං වක්කලී කිං තෙ ඉමිනා පූතිකායෙන දිට්ඨෙන, යොබො වක්කලී ධම්මං පස්සති සොමං පස්සති, යොමං පස්සති සො ධම්මං පස්සති.''

යන වැකියෙන්ද බුදුන් හා ධර්මය සමානත්වයෙන් සලකා ඇත. ධම්මදායාද සූත්‍රයෙහි '' භගවතොම්හි පුත්තො ඔරසො මුඛතො ජාතො ධම්මජො ධම්මනිම්මිතො ධම්මදායාදෙති, තං කිස්ස හෙතු තථාගතස්ස එතං අධිවචනං ධම්මකායො ඉතිපි බ්‍රහ්මකායො ඉතිපි ධම්මභූතො ඉතිපි.''

යන පාඨයත් මහායාන විශ්වාසවලට තුඩුදුන් පෙළ පාඨයකැයි සිතිය හැකිය. මේ හැරුණු විට බුද්ධකපාඨයේ එන '' ඉතිපි සො භගවා '' ආදී නව ගුණ පාඨවල එන අනුත්තර විජ්ජාචරණ සම්පන්න ආදි යෙදුම්ද මේවාට තුඩු දෙන්නට ඇතැයි සිතිය හැකිය. මජ්ඣිම නිකායේ '' ගොපක මොග්ගල්ලාන '' සූත්‍රයේ ආනන්ද හිමි හා ගොපක මොග්ගල්ලාන බමුණා අතර ඇතිවූ සාකච්ඡාවේදී '' සප්පටිසරණා මයං බ්‍රාහ්මණ ධම්මපටිසරණා '' යනුවෙන් දැක්වෙන පාඨයත් මජ්ඣිම නිකායේ මහාහත්ථිපදෝපම සූත්‍රයේ එන '' භගවා ජානං ජානාති පස්සං පස්සති චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො '' යන පාඨයත් එහිම '' යො ධම්මං පස්සති සො පටිච්ච සමුප්පාදං පස්සති '' යන පාඨයත් මහායාන ත්‍රිකාය විශ්වාසයට තුඩුදුන් පාඨ ලෙස සලකනු ලැබේ.

අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ ද්‍රොණ බමුණට දෙසූ දහමේදී '' සෙය්‍යථාපි බ්‍රාහ්මණ උප්පලංවා පදුමං වා පුණ්ඩරිකංවා උදකෙ ජාතං උදකෙ සංවඩ්ඪං උදකා අච්චුග්ගම්ම අනුපලිත්තං උදකෙන,එවමෙවං බ්‍රාහ්මණ මං ධාරෙහි දෙවො වා න භවිස්සාමි යක්ඛො වා ගන්ධබ්බො වා බුද්ධොති මං ධාරෙහි.''

යන පාඨයත් මහායානික අතිමානුෂිකත්වයට හා කාය විශ්වාසයන්ට තුඩුදුන් කොටස් ලෙස දැක්විය හැකිය. ථෙරවාදීන් එවැනිදේ අදහස් නොකළත් මහායානික විශ්වාසයන් ඒ අනුව ලියන්නට හැකිබැව් පැහැදිලි වේ. මෙහි සඳහන් ද්‍රොණ බමුණු ප්‍රශ්නයේදී බුදුන් දෙවියෙක් බඹෙක් මරෙක් නොවේනම් ඊට වඩා උසස් කෙනෙක් නොවේදැයි මහායානිකයෝ තර්ක කරති.



7—A 081356

මහායාන විශ්වාසයන්ට තුඩුදුන් තවත් කොටසක් නම් පශ්චාත් කාලීන සංස්කරණ ග්‍රන්ථයි. මිලින්ද පඤ්හයේ "ධම්මකායෙව භගවා මහාරාජ . . . . . වසති" ආදි වශයෙන් බුදුන් දෙසූ ධර්ම ස්කන්ධයෙහිම එතුමන් දැනට වසන බැව් සඳහන් වේ. බුදුගොස් හිමිගේ අත්ථසාලිනියෙහිද නිර්මාණ කාය ගැන සඳහන් වේ.

සද්ධම්ම සංග්‍රහයේ "සම්බුද්ධානං ද්වේ කායා — ධම්ම කායො සිරිධරො" යනුවෙන් එක් තැනෙක එන අතර තවත් තැනෙක පන්සාළිස් අවුරුද්දක් මුළුල්ලේ දෙසූ අසූහාරදහසක් ධර්ම ස්කන්ධයෝ බුදුවරුන් අසූහාර දහසක්ව දහම් දෙසතියි බුදුන් විසින් දේශනා කර ඇතැයි සඳහන් කරයි. විසුද්ධිමග්ගයේදී "යො පි සො භගවා අසීති අනුබ්‍යඤ්ජන පතිමණ්ඩිත ද්වත්තිංස මහාපුරිසලක්ඛණ නිම්මිත රූපකායො සබ්බාකාර පරිසුද්ධ සීලක්ඛන්ධාදී ගුණරතන සංසිද්ධ ධම්මකායො යසඃ මහන්ත පුඤ්ඤවන්ත අප්පටිපුග්ගලො අරහං සම්මා සම්බුද්ධො."

යනුවෙන් රූපකාය හා ධර්ම කාය යයි කායද්වයක් බුදුන්. විසින් දරන ලද බැව් සඳහන් වේ. අත්ථසාලිනිය අනුව බුදුන් දෙව්ලොවදී මාතෘ දිව්‍ය රාජයන්ට නිර්මාණ කායෙන් ධර්මදේශනා කළ බැව් සඳහන් වේ.

මෙසේ මේ යෙදුම් පශ්චාත්කාලීන මහායාන ග්‍රන්ථයන්ට බලපාන්නට ඇතැයි සිතිය හැකිය. ත්‍රිපිටකයේ බුදුන් සඳහා යෙදී ඇති විශේෂණ පදයන් ද තවත් ඔප් නංවා බුදුන්ට ආරෝපණය කර ඇතැයි ද සිතිය හැකිය. දිව්‍යාවදාන ලලිතවිස්තර වැනි ග්‍රන්ථවල එන ඇතැම් කොටස් පාලි ග්‍රන්ථවල සඳහන් කොටස්වලට සමානව තිබීමෙන් එම අදහස තව දුරටත් පැහැදිලි වේ.

දිව්‍යාවදානයේ රූපකාය විස්තරයක් දැක්වෙන තැනෙක "සොණකුටිකර්ණ" නමැත්තා බුදුන්ගේ රූපකාය දැකීමට ගිය බැව්ද වරෙක උපගුප්ත තෙරුන්හට බුදුන්ම එතුමන්ගේ රූපකාය මවා පෙන්වූ බැව්ද සඳහන් වේ.

මේ අනුව මහායානයේ මූලික අදහස්වලට පාදක වූයේ ථෙරවාදයේ ඇතැම් ධර්ම කොටස්ම බව සැලකිය හැකිය.